25 YEARS 1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES

# මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳ ප්‍රකාශය

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් 15 ප්‍රකාශයට පත්කර ඇති බව සහ 2023 ඔක්තෝබර් 03 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැනුම් දීමට කැමැත්තෙමු. පනත් කෙටුම්පතේ වගන්ති කිහිපයක් මූලික අයිතිවාසිකම්වලට බාධා කළ හැකි ආකාරය හා එමගින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ඛාදනය විය හැකි ආකාරය දැක්වෙන මූලික තොරතුරු වාර්තා මාලාවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2023 සැප්තැම්බර් 22 දින නිකුත් කරන ලදී. විශේෂයෙන්ම මාර්ගගත තර්ජනවලට වැඩි වශයෙන් ගොදුරු විය හැකි ළමුන් හා කාන්තාවන් වැනි පුද්ගල හා කණ්ඩායම් වෙනුවෙන් ආරක්ෂණ රාමු සකස් කිරීමේ  අවශ්‍යතාවය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මූලික වශයෙන් අවධාරණය කර සිටී. එසේවුවද, එවැනි පියවර ගතයුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සපයා ඇති මූලික අයිතිවාසිකම් හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුගත වෙමිනි. වර්තමාන පනත් කෙටුම්පතෙහි මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය අදාළ සැළකිල්ල එහි නමට පමණක් සීමා වී ඇති බව කණගාටුවෙන් වුවද දැනුම් දෙමු. ඒ අනුව, පනත් කෙටුම්පත සීමිත ආරක්ෂාවක් සහ පුළුල් විෂය ක්ෂේත්‍රයක් තුළ බලය අපයෝජනය කිරීමට හා විධායකයේ බලය පුළුල් කරන නීති මාලාවක් ලෙස හඳුන්වාදීමට රජය දරන නවතම උත්සාහයේ නිරූපනයක් ලෙස සැළකිය හැකිය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි අවධානය පනත් කෙටුම්පතෙහි අන්තර්ගතය හා නීති සම්පාදන ක්‍රියාවලිය යන දෙකොටසම යොමුවේ. යෝජිත පනත් කෙටුම්පත ගැටළුකාරී විධිවිධාන රැසකින් යුක්ත බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරණය කර සිටී. තහනම් ප්‍රකාශ සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය සංයුක්ත කර නිර්වචනය කර ඇති අපැහැදිළි සහ පුළුල් පාරිභාෂික පද, අන්තර්ජාලගත සන්නිවේදන සේවා සපයනු ලබන අන්තර්ජාල ප්‍රවේශසේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදින්ට රීති සෑදීමට පුළුල් බලයක් ලබා දෙන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම, පනත යටතේ අවශ්‍ය සියලු කරුණු සම්බන්ධයෙන් රෙගුලාසි සෑදීමට අමාත්‍යවරයාට බලය පැවරීම සහ සමාජ මාධ්‍ය තුළ ප්‍රකාශනයේ නිදහස දැඩි සීමාකිරීම්වලට ලක්කිරීම යනාදිය එම ගැටළුසහගත විධිවිධාන අතර වේ. පනත් කෙටුම්පතෙහි දණ්ඩනීය නීති පියවර අන්තර්ගත අතර එමගින් අදහස් ප්‍රකාශනයේ නිදහස මෙන්ම විසම්මුතියේ අයිතිය ඉලක්ක කර ඇත.

තවද, පනත් කෙටුම්පත ඉදිරිපත් කළ කාලය ගැන ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය අවධානය යොමුකරයි. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත හා සමගාමීව සංශෝධිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත එකම දිනකදී ප්‍රකාශයට පත්කිරීම අහඹු සිදුවීම් නොවන අතර මෙම කෙටුම්පත් ගෙන ඒමේදී දිස් වූ හදිසිසහගත බව ප්‍රජාතන්ත්‍ර විරෝධී ව්‍යස්වස්ථාදායක වැඩපිළිවළක පැහැදිළි නිරූපනයකි. මෙය වර්තමාන රජය විසින් ශ්‍රී ලංකාව තුළ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ විසම්මුතියේ අයිතිය මර්දන කළ හැකි නෛතික පාලන තන්ත්‍රයක් ගොඩනැගීමට දරන වෑයමක් ලෙස හැඳින්විය හැකිය.  එපමණක් නොව, යෝජිත නීති පුළුල් කිරීම මගින් 'ජාතික ආරක්ෂාව' යටතේ සපයා ඇති සීමාවන්වල විෂය පථය පුළුල් කිරීම මගින් එම මූලික අයිතිවාසිකම් සීමාවන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දරන අදහසයි. එමගින්

විධායක ජනාධිපති ධුරයේ බලතල පුළුල් වන අතර ශ්‍රී ලංකාවේ මානව හිමිකම්, ආණ්ඩුකරණය හා ප්‍රජාතන්ත්‍රවාදය වෙත භයානක ප්‍රතිඵල අත්විය හැකිය.

පසුගිය කාල වකවානුව තුළ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ විසම්මුතියෙහි අයිතිය සීමාකරන නීති සම්පාදනයට අනුප්‍රාප්තික ආණ්ඩු විසින් විවිධ උත්සහයන් ගෙන ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරණය කර සිටී. නිදසුනක් ලෙස, 2015 දී, වෛරී ප්‍රකාශ, වාර්ගික ප්‍රචණ්ඩත්වය සහ අසමගිය ඇතිකිරීම සාපරාධීකරණය සඳහා දණ්ඩ නීති සංග්‍රහය හා අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීමට යෝජනා කරන ලදී. 2021 දී, අන්තර්ජාලය හරහා අසත්‍ය සහ නොමගයවනසුලු ප්‍රකාශ ප්‍රචාරණයට එරෙහිව ආරක්ෂාව සැපයීම සඳහා නීති කෙටුම්පත් කිරීමට කැබිනට් අනුමැතිය හිමි විය. රජය විසින් ගැසට් කිරීමට නියමිත යෝජිත විද්‍යුත් විකාශන නියාමන අධිකාරී පනත් කෙටුම්පත ද ඉදිරිපත් කර ඇති සන්දර්භයක් තුළ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත හඳුන්වා දී ඇති බව විශේෂයෙන් සඳහන් කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ වෙසෙන පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ව්‍යවස්ථාදායක ප්‍රයත්නයන් ආපසස්සට හැරවීමටත් මේ ආකාරයේ පනත් කෙටුම්පත් නීතිගත කිරීමේ ක්‍රියාවලි පිළිබඳවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිරන්තර අවධානය යොමුකර සිටී. එබැවින්, පනත් කෙටුම්පත ඉල්ලා අස්කරගන්නා ලෙසත් විනිවිදභාවයෙන් යුත් සහ විවිධ පාර්ශවකරුවන් දැනුවත් කර මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ශක්තිමත් සහ ආරක්ෂිත අන්තර්ජාල අවකාශයක් නිර්මාණය කිරීමේ අරමුණින් නීතියක් කෙටුම්පත්කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලෙසත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳ වැඩිදුර අදහස් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට නියමිත ය.